**<u>පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2023.02.09 වන දින පැවැති මාසික මහා සභා රැස්වීම් වාර්තාව.</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම 2023 පෙබරවාරි මස 09 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු උපසභාපති | - | ඩී.වී.උපාලි මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.ආරියරත්න මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.බිමල්ක ප්‍රමෝද්‍යා මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.පියසේන මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සෙල්වනායගම් රගවන් මැතිතුමා. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී. (මන්ත්‍රීතුමියගේ දරුවො දෙන්නා)

**01. පසුගිය සභා වාර්තාව සහා සම්මත කිරීම. ( 2023.01.12 )**

2023.01.12 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් , සංශෝධන නොමැති නම් එම වාර්තාව සහා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඒ අනුව 2023.01.12 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමන් විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදනය.**
**03. සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**
**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**
**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

## I. ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.

**01.** 2022 වර්ෂයට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 01**

2022 වර්ෂයට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**02.** පහත නම් සඳහන් සේවකයන්ගේ ගිවිසුම් කාලය වසරක් සම්පූර්ණ වන දිනයේ සිට ඉදිරියට වසරකින් දීර්ඝ කිරීමට යෝජනා කරමි.

| නම | තනතුර | ගිවිසුම අවසන් වන දිනය |
|---|---|---|
| එම්.ඩී.බී.වැලිගමගේ මයා | මුරකරු | 2023.03.20 |
| ආර්.එම්.ටී.රත්නාවතී මිය. | සෞඛ්‍ය කම්කරු | 2023.04.22 |
| එච්.කාන්තිරත්න මිය. | සෞඛ්‍ය කම්කරු | 2023.04.23 |
| ආර්.එස්.කුසුමාවතී මිය. | සෞඛ්‍ය කම්කරු | 2023.04.24 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 02**

ඉහත නම් සඳහන් සේවකයන්ගේ ගිවිසුම් අවසන් වන දිනයේ සිට එම ගිවිසුම් කාලය ඉදිරියට වසරකින් දීර්ඝ කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** රජයේ තක්සේරු දෙපාර්තමේනතුව විසින් අංක RT/LM/10362 හා 2023.01.18 වන දිනැති ලිපියෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් විද්‍යාල මාවත පිහිටි කඩ කාමර 03ට අයත් බිම් කොටස වාර්ෂික බිම් බදු ලබා දීම සඳහා 2023 වර්ෂයට අදාල වාර්ෂික බිම් බදු මුදල පහත පරිදි තක්සේරු කර වාර්තා කර ඇත.

| අනු අංකය | බිම් බදු ගත් අයගේ නම | පවත්වා ගෙන යන ව්‍යාපරය | වාර්ෂික බදු මුදල |
|---|---|---|---|
| 01 | හරේන්ද්‍ර චන්ද්‍ර කුමාර | වීමෝල | රු.120,000.00 |
| 02 | ආර්.ඒ.නිමල් රූපසිංහ | යතුරු පැදි සේවා ස්ථානය | රු.120,000.00 |
| 03 | කේ.ඒ.නිමල් කරුණාතිලක | පොල්තෙල් අලෙවිසැල | රු. 68,000.00 |

එබැවින් 2023 වර්ෂයේ සිට බිම්බදු වශයෙන් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලද තක්සේරු වටිනාකම මත ගාස්තු අය කරන්නේ ද යන්නත් , මෙතෙක් මේ සඳහා භාවිතා කළ කඩකුලී ගිවිසුම වෙනස් කර නව කොන්දේසි ඇතුලත් කර බිම්බදු වලට අදාලව නව ගිවිසුමක් සකස් කළ යුතු ද යන්නත් තීරණය කිරීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 03**

රජයේ තක්සේරු දෙපාර්තමේනතුව විසින් අංක RT/LM/10362 හා 2023.01.18 වන දිනැති ලිපිය මඟින් දක්වා ඇති පරිදි පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් විද්‍යාල මාවත පිහිටි කඩ කාමර 03ට අයත් බිම් කොටස සඳහා 2023 වර්ෂයේ සිට බිම්බදු වශයෙන් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලද තක්සේරු වටිනාකම මත ඉහත පරිදි ගාස්තු අය කිරීම සුදුසු බවටත් , මෙතෙක් මේ සඳහා භාවිතා කළ කඩකුලී ගිවිසුම වෙනස් කර නව කොන්දේසි ඇතුලත් කර බිම්බදු වලට අදාලව නව ගිවිසුමක් සකස් කිරීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**04.** 1987.09.30 දින නිකුත් කර ඇති අංක 05/01/119 යටතේ නිකුත් කරනු ලැබූ සැලසුම් චක්‍රලේඛ අංක 020/01/150 යටතේ නිකුත් කරනු ලැබූ චක්‍රලේඛ අංක 14 ප්‍රකාරව දැනුම් දී ඇති පරිදි නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කර ඇති පළාත් පාලන ආයතනයක නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ඒකාබද්ධ බැංකු ගිණුමක් පිහිට විය යුතු බව 2023.01.17 දිනැති ලිපිය මඟින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා එවා ඇත.සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ නීත්‍යානුකූලව අනුමත නොකර සාදන ලද ගොඩනැගිල්ලක් අනුමත කිරීමට ඉල්ලීම් කරන විට ලබා ගන්නා දඩ මුදල නීත්‍යානුකූලව නාගරික සංවර්ධන අධිකාරිය හා සභාව ඒකාබද්ධ බැංකු ගිණුමක් පිහිටුවා තැන්පත් කළ යුතු බව ය.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ පෙර නාගරික සංවර්ධන අධිකාරියට අයිති වී නොතිබුන නිසා පෙර ඉදිකරන ලද ගොඩනැගිලි සඳහා මෙලෙස දඩ අය කිරීමේ දී අසාධාරණයක් සිදු වන බවත් , එවැනි ගොඩනැගිලි බොහොමයක් පවතින බවත් , එනිසා මෙහි දී වකවානුවක් තීරණය කිරීම සුදුසු බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පෙර ඉදිකරන ලද ගොඩනැගිලි වලට ප්‍රාදේශීය සභාවේ නීතියක් පවතින බවත් , එනිසා පෙර සාදා ඇති ගොඩනැගිල්ලක් ප්‍රාදේශීය සභා පනතේ සඳහන් ආකාරයට අනුමත වී තිබිය යුතු බවත් , පළාත් පාලන ආයතනය හා නාගරික සංවර්ධන අධිකාරිය බලාත්මක වූ දිනයේ සිට එම නීත්‍යානුකූල ක්‍රමවේදයට ගොඩනැගිලි සකස් කර තිබිය යුතු බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා පවසා සිටියේ ප්‍රාදේශීය සභාවේ අනුමැතිය නොමැතිව පෙර ඉදිකරන ලද ඉදිකිරීම් වලට ප්‍රාදේශීය සභාවෙන් මුදලක් අය කරනව ද යන්න ය.තව ද වර්තමානයේ අනවසර ඉදිකිරීම් බොහොමයක් ඉදි වන බවත් , එම ඉදිකිරීම් සමඟ ගංවතුර අවධානම වැඩි වන බවත් , පහුගිය ගංවතුර තත්වයන් වලදී ද නොසිතූ අකාරයෙන් ප්‍රදේශ යට වූ බවත් , විශාල කරදරයක් ඇති විය හැකි බවත් , මේ ආකාරයට ගියහොත් පැල්මඩුල්ල ද ජල කලාපයක් බවට පත් වන බවත් ය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ බැංකු ණය ගැනීමේ දී ප්ලෑන් එක අනුමත කර ගැනීමට දැමීමේ දී එය අනවසර ඉදිකිරීමක් නම් ඉහත ආකාරයට අදාල නීත්‍යානුකූල ක්‍රමවේදයට සිදු කරන බවත් , අනවසර ඉදිකිරීම් සම්බන්ධව තොරතුරු ලැබෙන විට වහාම ඒ පිළබඳව සභාව දැනුවත් කරන ලෙසත් එවිට එම අනවසර ඉදිරිකීම් ඉවත් කිරීමට කටයුතු කළ හැකි බවත් ය.

**<u>තීරණ අංක 04</u>**

1987.09.30 දින නිකුත් කර ඇති අංක 05/01/119 යටතේ නිකුත් කරනු ලැබූ සැලසුම් චක්‍රලේඛ අංක 020/01/150 යටතේ නිකුත් කරනු ලැබූ චක්‍රලේඛ අංක 14 ප්‍රකාරව දැනුම් දී ඇති පරිදි නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කර ඇති පළාත් පාලන ආයතනයක් ලෙස පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය අතර ඒකාබද්ධ බැංකු ගිණුමක් පිහිට වීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**05.** කහවත්ත , ඕපනායක පාර , 81 ¼ පදිංචි අඩු ආදායම්ලාභී එන්.මානෙල් ජයසිංහ යන අයට සෙවිලි අධාර ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 05</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර කහවත්ත , ඕපනායක පාර , 81 ¼ පදිංචි අඩු ආදායම්ලාභී එන්.මානෙල් ජයසිංහ යන අයට සෙවිලි අධාර ලබා ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** ර/රිල්හේන දෙමළ විද්‍යාලයේ අපවිත්‍ර ජලය හා වැසි ජලය බැහැර කිරීමට නිසි කාණු පද්ධතියක් නොමැති නිසා පාසල ඉදිරිපිට මාර්ගය හා පාසල අතර කාණු පද්ධතියක් ඉදිකර කොන්ක්‍රීට් ආවරණය කළ යුතු බවත් , මෙම ගැටළුවට තාවකාලික විසඳුමක් ලෙස අඩි 1 ½ පළල සිලින්ඩර් 03ක් යොදා රාජපක්ෂ මහතාගේ නිවසට යන මාර්ගයෙන් කාණුවක් සකස් කර ගන්නා ලෙස ප්‍රාදේශීය සභාවේ තාක්ෂණික නිලධාරී මහතා උපදෙස් ලබා දුන් නමුත් ඉතා අඩු ආදායම්ලාභී දෙමව්පියන්ගේ දරුවන් පාසලේ අධ්‍යාපනය හදාරන බැවින් එවැනි සංවර්ධන කටයුත්තක් සඳහා මුදල් ප්‍රතිපාදන නොමැති බවත් , මෙම ගැටළුවට කඩිනම් විසඳුමක් ලබා දෙන ලෙසත් එම විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් ඉල්ලීමක් කර ඇත.සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ කාලයක් සිට පැවත එන ගැටළුවක් බවත් , හැකියාවක් පවතී නම් මෙය සිදු කර දෙන ලෙසත් ය.

**<u>තීරණ අංක 06</u>**

ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර , ලබා දෙන වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**II. ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමාගේ යෝජනා.**

**01.** මා නීත්‍යානුකූලව ප්‍රාදේශීය සභාවේ නිවාඩු ගෙන සිටි මාස 03 සඳහා දීමනාව ලබා දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය - 2005.06.08 මඟින් දක්වා ඇති රීති ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.එහි දී විශේෂයෙන් 3 (1) (iii) හා 3 (2) රීති පිළිබඳව අවධානය යොමු කර දීමනාව ගෙවීමේ දී මතු වන ගැටළු පිළිබඳව පෙන්වා දෙන ලදී.

නමුත් එහි දී ගරු උප සභාපතිතුමා විසින් මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්ගෙන් ඉල්ලීම් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**තීරණ අංක 07**

ඉහත යෝජනාව සලකා බලා , පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ඇතිව ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමාට නීත්‍යානුකූලව ප්‍රාදේශීය සභාවේ නිවාඩු ලබා ගෙන සිටි මාස 03 සඳහා දීමනාව ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**හදිසි යෝජනා.**

**ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ හදිසි යෝජනා.**

**01.** 2022 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලට අදාලව පහත නම් සඳහන් කමිටු සාමාජිකයින්ගෙන් සමන්විත තක්සේරු කමිටුව , අපහරණ කමිටුව හා වෙන්දේසි කමිටුව පත් කිරීමට යෝජනා කරමි.

**තක්සේරු කමිටුව**

බුද්ධික ගයාන් ප්‍රේමරත්න මයා - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
වී.එම්.අයි.එස්.යෝගරත්න මයා - කාර්මික නිලධාරී
ඩිපෝ ඉන්ජිනේරුතුමා - රත්නපුර
යූ.ජී.ඩී.ඩබ්.උඩගෙදර මිය - ආදායම් පරීක්ෂක
බී.ඒ.ඒ.ඊ.ජයවර්ධන මිය - සංවර්ධන නිලධාරී

**වෙන්දේසි කමිටුව**

කේ.ඩී.ඩී.එච්.කොළමුන්න මයා - විමර්ෂන නිලධාරී
බී.ඒ.ඒ.ඊ.ජයවර්ධන මිය - සංවර්ධන නිලධාරී
ඩී.පී.එස්.සංජීව මයා - සංවර්ධන නිලධාරී
එච්.එච්.ඩී.එම්.ගුණසේකර මිය - කළමනාකරණ සේවා නලධාරී
ආර්.ඒ.ඩී.ආර්.රණසිංහ මිය - සංවර්ධන නිලධාරී

**අපහරණ කමිටුව**

කේ.ඩී.ඩී.එච්.කොළමුන්න මයා - විමර්ෂන නිලධාරී
එච්.කේ.ආර් ද සිල්වා මිය - සංවර්ධන නිලධාරී
ඩීබ්.එම්.ඩබ්.කුමාරතුංග මයා - සංවර්ධන නිලධාරී
ඒස.රත්නාවතී මැණිකේ මිය - සංවර්ධන නලධාරී
කේ.එච්.ජේ.ජයසිංහ මිය - සංවර්ධන නිලධාරී

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 08**

2022 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලට අදාලව ඉහත නම් සඳහන් කමිටු සාමාජිකයින්ගෙන් සමන්විත තක්සේරු කමිටුව , අපහරණ කමිටුව හා වෙන්දේසි කමිටුව පත් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** ජාතික තරුණ සේවා සභාවේ පැල්මඩුල්ල ගොඩගම පුහුණු මධ්‍යස්ථානයේ තොරතුරු තාක්ෂණ සන්නිවේදන ශිල්පි (NVQ-4) පරිගණක පාඨමාලාව හදාරා , කාර්යස්ථ පුහුණුව සඳහා අප ආයතනය වෙත යොමු කර ඇති රක්වාන පාර , ගොඩගම , පැල්මඩුල්ල ලිපිනයෙහි පදිංචි එම්.ඒ.කුෂාරා තත්සරණී පෙරේරා මෙනවිය කිසිදු ගෙවීමකින් තොරව මාස 06ක පුහුණුව නිම කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 09**</u>
ජාතික තරුණ සේවා සභාවේ පැල්මඩුල්ල ගොඩගම පුහුණු මධ්‍යස්ථානයේ තොරතුරු තාක්ෂණ සන්නිවේදන ශිල්පි (NVQ-4) පරිගණක පාඨමාලාව හදාරා , කාර්යස්ථ පුහුණුව සඳහා අප ආයතනය වෙත යොමු කර ඇති රක්වාන පාර , ගොඩගම , පැල්මඩුල්ල ලිපිනයෙහි පදිංචි එම්.ඒ.කුෂාරා තත්සරණී පෙරේරා මෙනවිය හට කිසිදු ගෙවීමකින් තොරව 2023.03.01 දින සිට මාස 06 ක පුහුණුව නිම කිරීමට අවස්ථාව ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**03.** 2022.12.08 දින සභාවේ දී තීරණ අංක 09 යටතේ 2023 මාර්තු මස 09 වන දින මහ සභාව පැවැත්වීමට තීරණය කර තිබුන ද එදින පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට නියමිත බැවින් මහා සභාව 2023 මාර්තු මස 02 වන දින පැවැත්වීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 10**</u>
2022.12.08 දින සභාවේ දී තීරණ අංක 09 යටතේ 2023 මාර්තු මස 09 වන දින මහ සභාව පැවැත්වීමට තීරණය කර තිබුන ද එදින පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට නියමිත බැවින් මහා සභාව 2023 මාර්තු මස 02 වන දින පැවැත්වීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.
<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමාගේ හදිසි යෝජනා.**</u>

**01.** ලෙල්ලොපිටිය කන්ද උඩ මාරගස් වංගුව අසල සතිපොළක් ආරම්භ කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ප්‍රදේශයේ ව්‍යාපාරිකයන්ට , ප්‍රදේශයට වැඩි අවස්ථාවක් දෙන්න පුළුවන් බව ගරු සභාපතිතුමා පවසන ලදී.

එම ස්ථානය නිතර අනතුරු සිදු වන ස්ථානයක් නිසා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඒ සඳහා අවස්ථාව ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදී.

<u>**තීරණ අංක 11**</u>
ඉහත යෝජනාව සම්බන්ධව ආදායම් පරීක්ෂකතුමියගේ ස්ථානීය පරීක්ෂණ වාර්තාව සලකා බලා , මාර්ග සංවර්ධන අධිකාරියේ හා රත්නපුර පොලීසියේ අවසරය ලබා ගෙන ලෙල්ලොපිටිය කන්ද උඩ මාරගස් වංගුව අසල සතිපොළක් ආරම්භ කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**06. කාරක වාර්ථා සලකා බැලීම - 2023-01-12 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම.**

ඒ අනුව 2023.01.12 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**07. 2023-01-01 සිට 2023-01-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සලකා බැලීම.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ 2023-01-01 සිට 2023-01-31 දක්වා වූ ගෙවීම් වාර්තාවේ වවුචර් අංක 0067 , 0119 , 0122 යටතේ PD – 7614 කැබ් රථයට ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් රු.273,300.00 ක මුදලක් ගෙවා ඇති බවත් , අරපිරිමැස්මෙන් ඉන්ධන භාවිතා කළ යුතු බවත් ය.

ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ඉන්ධන ලීටර් 1ක් රු.405.00 ක් වන බවත් , 2022 දෙසැම්බර් මස 13 හා 2023 ජනවාරි 16,17,19,22,24 යන දිනයන්හි දී ලබා ගත් ඉන්ධන වෙනුවෙන් කළ ගෙවීම රු.273,300.00 ක් වන බව ය.

ඒ අනුව 2023-01-01 සිට 2023-01-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හාලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී .ඒ.ඉන්දික මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**08.** **වෙනත් කරුණු.**

- **සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම්.**

<u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමා</u>

සංවර්ධන යෝජනා මුදල් ප්‍රතිපාදන නොමැති වීම නිසා කඩිනමින් ම ක්‍රියාත්මක කළ නොහැකි බවත් , මාර්තු 09 වන දින පැවැත්වෙන මැතිවරණය සඳහා ඉල්ලම් කරන සියලු දෙනාටම ජයග්‍රහණය ප්‍රාර්ථානා කරන බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

- **පසුගිය සභාවේ ලබා ගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගිතිය සාකච්ඡා කිරීම.**
- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වය හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමාහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **මීළඟ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.**

මහා සභාව 2023 මාර්තු මස 02 වන දින පැවැත්වීමට තීරණය විය.

- **සභාපතිතුමාගේ ස්තුති කතාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උප සභාපතිතුමන් , ගරු විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් , මාධ්‍යවේදී මහතාටත් ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

පෙ.ව.11.00 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.

ප්‍රාදේශීය සභා ................................................................ මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ................................................................ මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2023-03-02වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදීය.